C
150
RAH

# රාජ්‍ය පරිපාලනයට පදනම්වන මනෝවිද්‍යාත්මක මූලධර්ම පිළිබඳ දාර්ශනික විග්‍රහයක්

ශාස්ත්‍රපති උපාධි නිබන්ධනය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය
ශ්‍රී ලංකාව
1988

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

පූජ්‍ය නිකහැටියේ රාහුල

416844 X

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

## පර්යේෂණ සාරාංශය

නිබන්ධන මාතෘකාව: රාජ්‍ය පරිපාලනයට පදනම්වන මනෝවිද්‍යාත්මක මූලධර්ම පිළිබඳ දාර්ශනික විග්‍රහයක්.

ඉහත සඳහන් තේමාව යටතේ, 1988 වසරේ ශාස්ත්‍රපති උපාධිය සඳහා ඉදිරිපත්කරන ලද මෙම පර්යේෂණාත්මක නිබන්ධනය පරිච්ඡේද සතකින් සමන්විත වූවකි. එකී පරිච්ඡේදයන් පහත සඳහන් මූලික තේමාවන් ඔස්සේ, විකාශනය කරන ලද්දෙමු. එනම්:

1. රාජ්‍ය පරිපාලනය සහ එහි මනෝවිද්‍යාත්මක පරිමාණය.
2. රාජ්‍ය පරිපාලනයට සම්බන්ධ මනෝවිද්‍යාත්මක මූලධර්ම
3. කළමනාකරණමය මනෝවිද්‍යාව සහ පිරිස් පරිපාලනය
4. පිරිස් පරිපාලන මනෝවිද්‍යාවට අදාළ සිද්ධාන්ත
5. රාජ්‍ය පරිපාලන මනෝවිද්‍යාවෙන් අපේක්ෂිත ඵල ප්‍රයෝජන
6. රාජ්‍ය පරිපාලන චර්යාව සහ මනෝවිද්‍යාත්මක ආකල්ප
7. සමාලෝචනය

මෙහි එක් එක් පරිච්ඡේදයක් පහත සඳහන් මූලික මනෝවිද්‍යාත්මක අධ්‍යයන සිද්ධාන්ත ඔස්සේ ඉදිරියට ගෙනයාමට අපි උත්සහ කළෙමු.

1. අභිප්‍රේරණය
2. විමර්ශනය
3. සංවිධානය
4. උපයෝගිතාවය

ඒ අනුව පළමු පරිච්ඡේදයෙන් රාජ්‍ය පරිපාලනයේ මනෝවිද්‍යාත්මක පරිමාණය පිළිබඳ කරුණු ගවේෂණය කිරීම සිදුකරන ලදි. එම කාර්ය භාරයේදී, නව රාජ්‍ය පරිපාලනය කුමන දිශානතියක් ඔස්සේ ගමන්කරයිද යන වග ප්‍රකට කරමින්, මනෝවිද්‍යාත්මක සංකල්ප රාජ්‍ය පරිපාලනයට සම්බන්ධවන ආකාරයත්, පරිපාලන සංකල්පයේ අර්ථ නිරූපනය හා විද්‍යාත්මක ස්වභාවය පිළිබඳවත් කරුණු දැක්වුවෙමු. අනතුරුව රාජ්‍ය පරිපාලනයේ විෂය ක්ෂේත්‍රය සහ ස්වභාවය පිළිබඳ අවධානය යොමුකරමින්, සහ ශ්‍රී ලංකා රාජ්‍ය පරිපාලනයේ ඉතිහාසය සැකෙවින් ගෙනහැර දක්වමින් නව රාජ්‍ය පරිපාලනය මනෝවිද්‍යාත්මක පරිමාණයකින් හෙබි සුවිශේෂී කර්තව්‍යයක් බව තහවුරු කිරීමට උත්සහ ගත්තෙමු.

දෙවන පරිච්ඡේදය තුළදී අප උත්සහ දැරුවේ රාජ්‍ය පරිපාලනයට සම්බන්ධවන කේන්ද්‍රීය මනෝවිද්‍යාත්මක මූලධර්ම සමහරක් පිළිබඳ දාර්ශනික දෘෂ්ටි කෝණයෙන් විමර්ශනයක් ඉදිරිපත් කිරීමටයි. දාර්ශනික මනෝවිද්‍යාත්මක දෘෂ්ටිකෝණ යෙන්, හසුරුවන ලද මෙම විමර්ශනයේදී, රාජ්‍ය පරිපාලනය දාර්ශනික පරිමාණයකින් යුතු විෂය ක්ෂේත්‍රයක් බව තහවුරුකිරීම සඳහා, රාජ්‍ය පරිපාලන සිද්ධාන්ත හා ප්‍රති පත්ති දර්ශනයට සම්බන්ධ වන අයුරුත්, ඥානවිභාගය, සංවිධානචර්යාව, පොදුයහපත මූලික මානව අයිතිවාසිකම්, නිලධාරිවාදය හා ප්‍රජාතන්ත්‍රවාදය වැනි තේමා දාර්ශනික විමර්ශනයකට බඳුන් කරන ලදී.

රාජ්‍ය පරිපාලනයේ ඉතාවැදගත් අංශදෙකක් වන කළමනාකරණ මනෝ විද්‍යාව සහ පිරිස් පරිපාලනය පිළිබඳ මනෝවිද්‍යාත්මක මූලයන් පරිපාලනයේදී කාර්යක්ෂමතාවයත් ඵලදායිකත්වයත් රක්ෂණය කිරීම සඳහා උපයෝගීවන අයුරු තුන් වන පරිච්ඡේදයේදී පැහැදිළිකිරීමට වෙර යෙදුවෙමු. මෙහිදී කළමණාකරණ ක්‍රියා වලියේ මනෝවිද්‍යාත්මක පදනම ප්‍රකට කරවමින්, වෘත්තීය සංගම් ප්‍රකට කරන මනෝ විද්‍යාත්මක පරිමාණය තහවුරුකිරීමට විශේෂ වෑයමක් දරන ලදී. වෘත්තීය සංගම් දේශපාලන අවශ්‍යයතාවයක්ය යන දුර්මතය බිඳදැමීමට එයින් උත්සහ දැරුවෙමු. අනතුරුව රාජ්‍ය පරිපාලකයින් මනෝවිද්‍යාත්මකව පුහුණුකිරීමේ අවශ්‍යයතාවයත්, ඒ සඳහා අදාළකරගතහැකි විධික්‍රම ගැනත් කරුණු දක්වමින්, රාජ්‍ය සේවයේදීත්, පරිපාලන සේවයේදීත්, කාර්ය විග්‍රහක ඇති අවශ්‍යයතාවයත්, එයින් කාර්යක්ෂමතාවය ඵලදායිකත්වය රක්ෂණය කරගතහැකි අයුරුත් විග්‍රහ කරන ලදී. තවද අභිප්‍රේරණය සහ ඉච්ඡාභංගත්වය රාජ්‍ය පරිපාලනයට බලපාන අයුරු දක්වමින්, මනෝවිද්‍යාවේ සුවිශේෂී අංගයක් වන පාරිභෝගික මනෝවිද්‍යාව පිරිස් පරිපාලනයට සම්බන්ධවන ආකාරය ප්‍රකට කරමින්, රාජ්‍ය පරිපාලන ක්‍රියාදාමයේදී පාරිභෝගික මනෝවිද්‍යාව කිසිසේත් ඉවත දැමිය නොහැකි මනෝවිද්‍යා සාඛාවක් ලෙස තහවුරු කිරීමට උත් සාහයක් ගත්තෙමු.

හතරවන පරිච්ඡේදය රාජ්‍ය පරිපාලන මනෝවිද්‍යාව හා සබැඳි පිරිස් පරිපාලන මනෝවිද්‍යාව පිළිබඳ කරුණු සාකච්ඡාකිරීමට වෙන් කරන ලදී. එහිදී පිරිස් තේරීමත් ඇගයුම් කරණයත් මනෝවිද්‍යාත්මකව කළයුතුබව තහවුරු කරමින් රාජ්‍ය පරිපාලන සංවිධානයන් හිදී පරිපාලකයන් මුහුණ පාන උභතෝකෝටික ගැටළු ප්‍රශ්න මනෝවිද්‍යාත්මක සාකච්ඡාවකට නතුකරන ලදී. එසේ කිරීමෙන් අප උත්සහ කළේ, රාජ්‍ය පරිපාලනයට මනෝවිද්‍යාවෙන් තොරව අනුගමනය කළහැකි වෙනත් විකල්පයක් නොමැති බව දැක්වීමටයි.

පස්වන පරිච්ඡේදයෙන් අපේක්ෂිත අරමුණු දෙකකි. පළමු අරමුණ වූයේ නිලධාරිවාදය සහ ධූරාවලියත්, අධිකාරමය දර්ශනයත්, රාජ්‍ය පරිපාලනයේ කාර්ය ක්ෂමතාවය සහඵලදායිකත්වය සුරැකීමට, අදාළ නොවන බව පෙන්වීමයි. දෙවනුව මනෝ විද්‍යාත්මක වශයෙන් රාජ්‍ය පරිපාලකයින් එල්බගෙන ඇති මිථ්‍යා පිටුදකිමින්

අධිකාරය වුවද මනෝවිද්‍යාත්මක පදනමක පිහිටුවා, ගනිමින් සංස්කෘතියට, පරිසර යට අනුව පරිපාලනය ප්‍රතිෂ්ඨාපනය කොට, මානව සබඳතා තහවුරු කිරීමෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ පවතින අවශ්‍යසහගත බැල්ම ඉවත් කළහැකිබව දැක්වීම දෙවන අරමුණ විය.

සයවන පරිච්ඡේදය තුළදී උත්සහ කළේ, පරිපාලන චර්යාව මනෝවිද්‍යාත්මක පදනමක් මත පිහිටා ඇතිබව ඒත්තුගැන්වීමටයි. එහිදී, රාජ්‍ය පරිපාලනය පදනම් විය යුත්තේ මානව හිතවාදී ආකල්පයන් මතබවත්, මේ සඳහා රාජ්‍ය පරිපාලකයා, මනෝවිද්‍යාත්මකවත්, සදාචාරාත්මකවත්, හැඩගැසීම ආවශ්‍යයක බව තහවුරු කිරීමට, පුද්ගලයා යම් යම් සංවිධානයන්ට සම්බන්ධ වී හැසිරෙන්නේ මනෝවිද්‍යාත්මක අවශ්‍යයතා මත බව පැහැදිළි කළෙමු. මේ කරුණු සනාථ කිරීමට සංවිධාන චර්යාව කෙරෙහි දැඩි අවධානයක් යොමු කරන ලදී.

සත්වන පරිච්ඡේදය වෙන් කරන ලද්දේ පර්යේෂණ නිබන්ධනය සමස්ථයක් වශයෙන් සමාලෝචනය කිරීම සඳහාය. මෙහිදී සාම්ප්‍රදායික චර්යාවාදී දෘෂ්ටිකෝණයට එරෙහිව, නව චර්යාවාදී ආකල්පයන් ස්මතූකරමින්, රාජ්‍ය පරිපාලනය මනෝවිද්‍යාත්මක පදනමක් මත තහවුරු කිරීමේ අවශ්‍යයතාවය ප්‍රකට කිරීමට උත්සහ දරා ඇත. මෙහිදී විශේෂ අවධානයක් පෙරදිග ලෝකයේ රාජ්‍ය පරිපාලන ක්‍රියාදාමය ප්‍රකට කිරීම සඳහා යොමු කළෙමු.